කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2694846
: 011 2694847 Ext -804/805
Fax : 011 2698311
E-mail : agromet12@yahoo.com
Web : www.meteo.gov.lk
: https://www.facebook.com/SLMetDept/

Agro meteorological Bulletin - කෘෂි කාලගුණ තොරතුරු ප්‍රකාශය

Vol: 41-2021 **41 වන සතිය** **41st Week**

ඔක්තෝබර් 01 සිට ඔක්තෝබර් 07 දක්වා සතිය තුල පැවති කාලගුණ තත්වයේ සාරාංශය:



රූපය 01
ඔක්තෝබර් 01 සිට ඔක්තෝබර් 07 දක්වා සතිය තුල වාර්තාවූ මුළු වර්ෂාපතනය(මි.මී)

- පැය 24 ක් තුල වාර්තා වූ වැඩිම වර්ෂාපතනය වන මි.මී 167.5 දුම්මලසුරිය (කුරුණෑගල) ප්‍රදේශයෙන් ඔක්තෝබර් 05 වන දින වාර්තා විය.

- උපරිම උෂ්ණත්වයේ සාමාන්‍යය අගයයට වඩා වැඩිවීමේ වැඩිම අගය සෙල්සියස් අංශක 2.5 ක් වූ අතර, එය ඔක්තෝබර් 07 වන දින සෙල්සියස් අංශක 32.6 ක් ලෙස රත්මලාන ප්‍රදේශයෙන් වාර්තා විය.

- අවම උෂ්ණත්වයේ සාමාන්‍යය අගයයට වඩා අඩු වීමේ පහලම අගය සෙල්සියස් අංශක 2.0 ක් වූ අතර, එය ඔක්තෝබර් 05 වන දා සෙල්සියස් අංශක 23.2 ක් ලෙස මන්නාරම ප්‍රදේශයෙන් වාර්තා විය.

ඇතුලත:

පසුගිය සතිය තුල පැවති කාලගුණ තත්වය

වර්ෂාපතනය
- දෛනික වර්ෂාපතනයන් පි. 02
- වැඩිම වර්ෂාපතන අගයයන් පි. 02
- වර්ෂාපතනයේ වෙනස්වීම පි. 03
- වර්ෂාපතනයේ වෙනස්වීමේ ප්‍රතිශතය පි. 03
- සමුච්චිත වර්ෂාපතනයේ හැසිරීම පි. 04

උෂ්ණත්වය
- උපරිම උෂ්ණත්වයේ වැඩිවීම පි. 07
- උපරිම උෂ්ණත්වයේ අඩුවීම පි. 07
- අවම උෂ්ණත්වයේ වැඩිවීම පි. 08
- අවම උෂ්ණත්වයේ අඩුවීම පි. 08
- පසුගිය සතිය තුල උපරිම/අවම පි. 09
- උපරිම/අවම උෂ්ණත්ව සාමාන්‍යයන් පි. 09

ඉදිරි සතිය සඳහා කාලගුණ තත්වය

පාංශු ජලය පි. 10

පාංශු උෂ්ණත්වය පි. 11

කෘෂි කාලගුණ පරාමිතීන් හි සති සාමාන්‍යයන් පි. 12

ඉදිරි සතිය සඳහා කාලගුණ අනාවැකිය පි. 14

ඉදිරි දින 20 සඳහා පස් දින කාලය තුල ලැබිය හැකි වර්ෂාපතන අගයයන්හි වෙනස්වීම පි. 15

කෘෂි කාලගුණ අංශය
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත
කොළඹ 07

Agromet Division
Department of Meteorology
383, Baudhaloka Mawatha
Colombo 07

පසුගිය සතිය තුළ පැවති කාලගුණය

1. වර්ෂාපතනය



රූපය 01



රූපය 02



රූපය 03



රූපය 04



රූපය 05



රූපය 06



රූපය 07

දිනය	වර්ෂාපතනය (මි.මී)	ප්‍රදේශය
2021-10-01	137.0	හෙල්බොඩ (නුවරඑළිය)
2021-10-02	142.0	අංගමැඩිල්ල (පොලොන්නරුව)
2021-10-03	76.8	වල්ලිපුරම් (යාපනය)
2021-10-04	82.0	නොච්චියාගම (අනුරාධපුරය)
2021-10-05	167.5	දුම්මලසූරිය (කුරුණෑගල)
2021-10-06	29.5	වරකාපොල (කෑගල්ල)
2021-10-07	14.0	යටියන්තොට (AWS)

වගුව 1. දිනක් තුළ පැවති ඉහළම වර්ෂාපතනය.

2. වර්ෂාපතනයේ වෙනස්වීම (Anomaly)



01 වන රූපය. 2021 ජනවාරි 01 සිට 2021 ඔක්තෝබර් 07 දක්වා වර්ෂාපතනය, සාමාන්‍යය (1981-2010) වර්ෂාපතන අගයයන්ට වඩා වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස



02 වන රූපය. 40 වන සතිය තුළ ලැබුණු වර්ෂාපතනය එම සතිය තුල සාමාන්‍යය (1981-2010) වර්ෂාපතන අගයයන්ට වඩා වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස

3. වර්ෂාපතනයේ වෙනස්වීමේ ප්‍රතිශතය

දිස්ත්‍රික්කය	වර්ෂාපතනය වැඩිවීම ප්‍රතිශතයක් ලෙස	වර්ෂාපතනය අඩුවීම ප්‍රතිශතයක් ලෙස
යාපනය	76.0%	-
මන්නාරම	101.0%	-
වවුනියාව	48.0%	-
අනුරාධපුරය	19.0%	-
ත්‍රිකුණාමලය	34.0%	-
පුත්තලම	64.0%	-
පොළොන්නරුව	61.0%	-
කුරුණෑගල	44.0%	-
මාතලේ	19.0%	-
මඩකලපුව	89.0%	-
අම්පාර	98.0%	-
මහනුවර	30.0%	-
කෑගල්ල	48.0%	-
නුවරඑළිය	22.0%	-
බදුල්ල	26.0%	-
ගම්පහ	29.0%	-
කොළඹ	36.0%	-
කළුතර	19.0%	-
ගාල්ල	49.0%	-
මාතර	37.0%	-
රත්නපුර	22.0%	-
හම්බන්තොට	27.0%	-
මොණරාගල	37.0%	-

වගුව 01. 2021 ජනවාරි 1 සිට ඔක්තෝබර් 07 දක්වා වාර්තා වූ මුළු වර්ෂාපතනය, සාමාන්‍යය වර්ෂාපතනය (1981-2010 සාමාන්‍යය) සමග වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස (2 රූපය)

දිස්ත්‍රික්කය	වර්ෂාපතනය වැඩිවීම ප්‍රතිශතයක් ලෙස	වර්ෂාපතනය අඩුවීම ප්‍රතිශතයක් ලෙස
යාපනය	476.0%	-
මන්නාරම	382.0%	-
වවුනියාව	54.0%	-
අනුරාධපුරය	107.0%	-
ත්‍රිකුණාමලය	499.0%	-
පුත්තලම	96.0%	-
පොළොන්නරුව	404.0%	-
කුරුණෑගල	84.0%	-
මාතලේ	-	3.0%
මඩකලපුව	-	7.0%
අම්පාර	228.0%	-
මහනුවර	-	18.0%
කෑගල්ල	71.0%	-
නුවරඑළිය	12.0%	-
බදුල්ල	186.0%	-
ගම්පහ	85.0%	-
කොළඹ	72.0%	-
කළුතර	-	48.0%
ගාල්ල	87.0%	-
මාතර	136.0%	-
රත්නපුර	66.0%	-
හම්බන්තොට	147.0%	-
මොණරාගල	197.0%	-

වගුව 02. 40 වන සතිය තුල (ඔක්තෝබර් 01 සිට ඔක්තෝබර් 07 දක්වා) වර්ෂාපතනය සති සාමාන්‍යය වර්ෂාපතනය (1981-2010 සාමාන්‍යය) සමග වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස (3 රූපය)

4. එක් එක් දිස්ත්‍රික්කයේ 2021 ජනවාරි 1 සිට ඔක්තෝබර් 07 දක්වා සමුච්චිත වර්ෂාපතනය සහ සාමාන්‍යය සමුච්චිත වර්ෂාපතනය (1981-2010) හැසිරීම.
















Ratnapura
RAINFALL (MM)
4000.0
3000.0
2000.0
1000.0
0.0
1 4 7 10 13 16 19 22 25 28 31 34 37 40 43 46 49 52
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Kandy
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10 13 16 19 22 25 28 31 34 37 40 43 46 49 52
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Matale
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10 13 16 19 22 25 28 31 34 37 40 43 46 49 52
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Nuwara Eliya
RAINFALL (MM)
3000.0
2000.0
1000.0
0.0
1 4 7 10 13 16 19 22 25 28 31 34 37 40 43 46 49 52
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Badulla
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10 13 16 19 22 25 28 31 34 37 40 43 46 49 52
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Monaragala
RAINFALL (MM)
2500.0
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10 13 16 19 22 25 28 31 34 37 40 43 46 49 52
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Ampara
RAINFALL (MM)
1500.0
1000.0
500.0
0.0
1 4 7 10 13 16 19 22 25 28 31 34 37 40 43 46 49 52
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Batticaloa
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10 13 16 19 22 25 28 31 34 37 40 43 46 49 52
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Trincomalee
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Anuradhapura
RAINFALL (MM)
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Polonnaruwa
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Vavuniya
RAINFALL (MM)
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Jaffna
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Mannar
RAINFALL (MM)
1000.0
800.0
600.0
400.0
200.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Puttalam
RAINFALL (MM)
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Kurunegala
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall

4. 40 වන සතිය තුල (ඔක්තෝබර් 01 සිට ඔක්තෝබර් 07 දක්වා) උපරිම උෂ්ණත්වයේ හැසිරීම

40 වන සතිය තුල උපරිම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය උපරිම උෂ්ණත්ව අගයයන් (1961-1990) සමග වාර්තා වූ වෙනස පහත පරිදි වේ.

4.1 උපරිම උෂ්ණත්වයේ වැඩිවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය වෙනස්වූ ඒකක ගණන (^0C)	සතිය තුල එම තත්වය පැවති දින ගණන
කටුගස්තොට, රත්මලාන	1 – 2	04
බණ්ඩාරවෙල	1 – 2	03
ගාල්ල, පුත්තලම, වව්නියාව	1 – 2	02
අනුරාධපුරය, කොළඹ, යාපනය කුරුණෑගල, නුවරඑළිය, රත්නපුරය ත්‍රිකුණාමලය	1 – 2	01

වගුව 01. සතියේ උපරිම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය උපරිම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා වැඩිවූ අංශක ගණන සහ සතිය තුල එම වැඩිවීම පැවති දින ගණන

සතියේ උපරිම උෂ්ණත්ව අගයයන්, ඒවායේ සාමාන්‍යය අගයයන්(1961- 1990) සමග සැසඳීමේදී උපරිම උෂ්ණත්වයේ වැඩිවීම, වගු අංක 01 හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 1 – 2ත් අතර අගයයක් ගනී. එලෙසම එම අගයයන්ගේම අඩුවීම වගු අංක 02හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 2 - 6ත් අතර අගයයක් ගනී.

4.2 උපරිම උෂ්ණත්වයේ අඩුවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය අඩුවූ අංශක ගණන (^0C)	සතිය තුල එම අඩුවීම පැවති දින ගණන
රත්නපුරය	2 – 4	03
යාපනය, මන්නාරම, රත්මලාන	2 – 4	02
අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ හම්බන්තොට, කටුනායක, කුරුණෑගල මහඉලුප්පල්ලම, පුත්තලම, වව්නියාව	2 – 4	01
අනුරාධපුරය, මහඉලුප්පල්ලම, රත්නපුරය ත්‍රිකුණාමලය, වව්නියාව	4 – 6	

වගුව 02. ප්‍රධාන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල සතියේ උපරිම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය උපරිම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා අඩුවූ අංශක ගණන සහ සතිය තුල එම අඩුවීම පැවති දින ගණන.

5. 40 වන සතිය තුල (ඔක්තෝබර් 01 සිට ඔක්තෝබර් 07 දක්වා) අවම උෂ්ණත්වයේ හැසිරීම.

40 වන සතිය තුල අවම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය අවම උෂ්ණත්ව අගයයන් (1961-1990) සමග ඇති වෙනස පහත පරිදි වේ.

5.1 අවම උෂ්ණත්වයේ වැඩිවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය වැඩිවූ අංශක ගණන (^0C)	සතිය තුල එම වැඩිවීම් පැවති දින ගණන
බණ්ඩාරවෙල, නුවරඑළිය	2 – 3	04
රත්මලාන	2 – 3	03
අනුරාධපුරය, ගාල්ල, යාපනය, කුරුණෑගල, පුත්තලම, වව්නියාව	2 – 3	02
බදුල්ල, මඩකලපුව, කටුගස්තොට කොළඹ, කටුනායක මහඉලුප්පල්ලම මන්නාරම	2 – 3	01

වගුව **01.** ප්‍රධාන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල අවම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය අවම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා වැඩිවූ ඒකක ගණන සහ සතිය තුල එම වැඩි වීම් පැවති දින ගණන

සතියේ අවම උෂ්ණත්ව අගයයන්, ඒවායේ සාමාන්‍යය අගයයන් (1961-1990) සමග සැසඳීමේදී,අවම උෂ්ණත්වයේ වැඩිවීම, වගු අංක 01 හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 2 - 3ත් අතර අගයයක් ගනී, බණ්ඩාරවෙල සහ නුවරඑළිය යන කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී එම වැඩිවීම දින 4කදී වාර්තාවී ඇත. එලෙසම එම අගයයන්ගේම අඩුවීම වගු අංක 02හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 1 - 2ත් අතර අගයයක් ගනී.

5.2 අවම උෂ්ණත්වයේ අඩුවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය අඩුවූ අංශක ගණන (^0C)	සතිය තුල එම අඩුවීම් පැවති දින ගණන
ත්‍රිකුණාමලය	1 – 2	02
මන්නාරම, පුත්තලම, රත්මලාන, බදුල්ල රත්නපුරය, මඩකලපුව, කොළඹ, ගාල්ල හම්බන්තොට, යාපනය, කටුනායක	1 – 2	01

වගුව **02.** අවම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය අවම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා අඩුවූ අංශක ගණන සහ සතිය තුල එම අඩුවීම් පැවති දින ගණන

6. 40 වන සතිය තුල උපරිම සහ අවම උෂ්ණත්වයන්හි ඉහළම වැඩිවීම් හා පහළම අඩුවීම්

		දිනය	ප්‍රදේශය	අංශක ගණන (^{0}C)	වාර්තා වූ උෂ්ණත්වය (^{0}C)
උපරිම උෂ්ණත්වය	ඉහළම වැඩිවීම	2021-10-07	රත්මලාන	2.5	32.6
	පහළම අඩුවීම	2021-10-01	ත්‍රිකුණාමලය	6.2	25.6
අවම උෂ්ණත්වය	ඉහළම වැඩිවීම	2021-10-07	ගාල්ල	3.5	27.6
	පහළම අඩුවීම	2021-10-05	මන්නාරම	2.0	23.2

7. 40 වන සතියේ සාමාන්‍යය උපරිම උෂ්ණත්වය හා අවම උෂ්ණත්වයන් එහි සති සාමාන්‍යය **(1961-1990,30 Year Average)** සමග ඇති වෙනස



රූපය 01



රූපය 02

01 වන රූපය මගින් උපරිම උෂ්ණත්වය වෙනස් වීම හා **02** වන රූපය මගින් අවම උෂ්ණත්වය වෙනස් වීම එහි සති සාමාන්‍යය **(1961-1990,30 Year Average)** සමග ඇති වෙනස පෙන්නුම් කරයි.

8.1 ඉදිරි සතිය තුල එක් එක් මට්ටම්වල පාංශු ජල ප්‍රමාණයයන් පිළිබඳ අනාවැකිය.

පොළොව තුල එක් එක් මට්ටම් වල පැවතිය හැකි පාංශු ජල ප්‍රමාණයන් ප්‍රතිශතයක් ලෙස පහත රූප සටහන් වලින් දක්වා ඇත. (ECMWF දත්ත යොදා ගෙන ගණිතමය ආකෘති මගින් ගණනය කරන ලදි)



රූපය 01 පොළොව මට්ටමේ සිට සෙ.මී. 7 ක් දක්වා වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.



රූපය 02 පොළොව මට්ටමේ සිට සෙ.මී. 7 .ත් සෙ.මී. 28 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.



රූපය 03 පොළොව මට්ටමේ සිට සෙ.මී. 28 ත් සෙ.මී. 100 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.



රූපය 04 පොළොව මට්ටමේ සිට සෙ.මී. 100 ත් සෙ.මී. 289 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.

ඉදිරි සතිය තුලදී පාංශු ජල මට්ටම දිවයිනේ තෙත් කලාපය ආශ්‍රිතව 40% - 50% ක පමණ ඉහල අගයයක් ගනී. අතරමැද කලාපයේදී 30% - 40 % ක පමණ සාමාන්‍ය අගයයක් ගනී. දිවයිනේ අනෙකුත් කොටස් වලදී පාංශු ජලමට්ටම සෙ.මී 0 - 28 සහ 100 - 289 අතර පරාස වලදීත් යාපනය,මොණරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක හැර සෙසු ප්‍රදේශ වලදී 25 % - 35 % පමණ සාමාන්‍ය අගයයක් ගනී. සෙ.මී. 28 -100 පරාසය තුලදී දිවයිනේ මොනරාගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වලදී 10% වඩා ඉතා අඩු අගයක් ගන්නා බව දැකගත හැක.

8.2 ඉදිරි සතිය තුල එක් එක් මට්ටම්වල පාංශු උෂ්ණත්වය පිළිබඳ අනාවැකිය.

පොළොව තුල එක් එක් මට්ටම් වල පැවතිය හැකි පාංශු උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක වලින් දක්වා ඇත.
(ECMWF දත්ත යොදා ගෙන ගණිතමය ආකෘති මගින් ගණනය කරන ලදි)



රූපය 05 පොළොව මට්ටමේ සිට සෙ.මී. 7 ක් දක්වා වන ස්ථරයේ පවතින පාංශු උෂ්ණත්වය.



රූපය 06 පොළොව මට්ටමේ සිට සෙ.මී. 7 .ත් සෙ.මී. 28 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු උෂ්ණත්වය.



රූපය 07 පොළොව මට්ටමේ සිට සෙ.මී. 28 ත් සෙ.මී. 100 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු උෂ්ණත්වය



රූපය 08 පොළොව මට්ටමේ සිට සෙ.මී. 100 ත් සෙ.මී. 289 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු උෂ්ණත්වය.

ඉදිරි සතිය තුලදී පාංශු උෂ්ණත්වය ගණනය කරන ලද මට්ටම් 4හි දීම (රූපය 05, 06, 07 සහ 08) නුවරඑළිය දිස්ත්‍රික්කය තුලදී සෙල්සියස් අංශක 10 -15 ක පමණ පහල අගයයකුත්, මධ්‍යම පලාතේ සෙසු දිස්ත්‍රික්ක වලදීත්, කෑගල්ල,රත්නපුර, සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වලදීත් සෙල්සියස් අංශක 25 ක පමණ තරමක පහල අගයයකුත්, දිවයිනේ තෙත් කලාපයේ ඉතිරි කොටස් වලදීත් අතරමැදි කලාප වලදීත් සෙල්සියස් අංශක 28 ක පමණ සාමාන්‍ය අගයයකුත්,වියලි කලාප තුලදී සෙල්සියස් අංශක 30 - 35 ක පමණ ඉහල අගයයකුත් බලාපොරොත්තු වේ.

9. ඉදිරි සතිය සඳහා කෘෂි කාලගුණ තත්ත්වය පිළිබඳ සති සාමාන්‍යයන්,

2000-2018 වසර වල වාර්තා වූ දත්ත වලට අනුව පහත සාමාන්‍යය අගයන් ගණනය කර ඇත.



වාශ්පීභවනය - මිමී/දින (Evaporation) mm/day



වර්ෂාපතනය - මිමී (Rainfall) mm



සාපේක්ෂ ආර්ද්‍රතාව 0830h- (Relative Humidity) %



සාපේක්ෂ ආර්ද්‍රතාව 1530h- (Relative Humidity)%



උපරිම උෂ්ණත්වය - සෙල්සියස් අංශක
(Maximum Temperature) - C^0



අවම උෂ්ණත්වය - සෙල්සියස් අංශක
(Minimum Temperature) - C^0



සූර්ය දීප්ත පැය ගණන
(Sunshine Hours)

10. ඉදිරි දින 7 සඳහා කාලගුණ අනාවැකිය,

10.1 2021 ඔක්තෝබර් 09 දින සිට ඔක්තෝබර් 15 දින දක්වා දෛනික වර්ෂාපතන අනාවැකිය.

(ECMWF 2021-10-08 වන දින දත්ත යොදා ගෙන ගණිතමය ආකෘති මගින් ගණනය කරන ලදි)



2021-10-09



2021-10-10



2021-10-11



2021-10-12



2021-10-13



2021-10-14



2021-10-15

ඉදිරි සතියේ දී දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ සාමාන්‍යය හැකියාවක් පවතින අතර, මෙම වැසි තත්වය මෙම කාලයේ සාමාන්‍ය වර්ෂාපතනයට වඩා අඩු අගයක් ගනු ඇත. එසේම මෙම තත්වය දිවයිනේ නිරිතදිග ප්‍රදේශ වලදී වැඩිවශයෙන් බලාපොරොත්තු වේ.

මෙහිදී ඔක්තෝම්බර් 09 දින දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ ඉතා අඩු හැකියාවක් පවතින නමුත් ඔක්තෝම්බර් 10-11 දින වල වැසි ඇතිවීමේ හැකියාව ඉහලයාමක් දැකගත හැක. මෙහිදී දිවයිනේ නිරිතදිග හා වයඹදිග ප්‍රදේශයන්හි වැසි ඇතිවීමේ වැඩි හැකියාවක් පෙන්නුම් කරයි. එසේම මෙම ප්‍රදේශයන් හි ඇතැම් ස්ථානයක තද වැසි ඇතිවීමක් ද අපේක්ෂා කරයි.

ඔක්තෝම්බර් 12 දින පැවති වැසි තත්වයේ සුළු අඩුවීමක් අපේක්ෂා කරන නමුත් තවදුරටත් දිවයිනේ නිරිතදිග ප්‍රදේශයේ සාමාන්‍යය වැසි ඇතිවීමක් බලාපොරොත්තු විය හැක. ඔක්තෝම්බර් 13 දින තවදුරටත් වැසි තත්වය අඩුවන අතර,පසු දින එනම් ඔක්තෝම්බර් 14 සිට නැවතත් දිවයිනේ නිරිතදිග ප්‍රදේශ වල වැසි ඇතිවීමේ හැකියාවේ ඉහල යාමක් අපේක්ෂා කරයි. ඔක්තෝම්බර් 15 දින නිරිතදිග ඇතැම් ස්ථානයක තරමක තද වැසි ඇතිවීමක් ද බලාපොරොත්තු විය හැක.

10.2 ඉදිරි සතිය තුල ලැබිය හැකි වර්ෂාපතනය පිළිබඳ අනාවැකිය.



රූපය 08 සතිය තුල ලැබෙන වර්ෂාපතනය



රූපය 09. සාමාන්‍යයයන් (1961-1990) සමඟ වෙනස් වීම (Rainfall Anomaly)

උපුටා ගැනීම: INDIAN INSTITUTE OF TROPICAL METEOROLOGY, PUNE, INDIA

1 සතිය: (ඔක්තෝම්බර් 08 -14)

දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ ඉතා අඩු හැකියාවක් පවතී. එසේම දිවයිනේ උතුරු, නැගෙනහිර හා උතුරුමැද පළාත් වල සාමාන්‍ය වැසි තත්වයම අපේක්ෂා කරන අතර, සෙසු ප්‍රදේශවල සාමාන්‍යය වැසි තත්වයට වඩා අඩුවීමක් අපේක්ෂා කරයි.

2 සතිය: (ඔක්තෝම්බර් 15 -21)

දිවයිනේ නිරිතදිග ප්‍රදේශ ආශ්‍රිතව වැසි ඇතිවීමේ සාමාන්‍යය හැකියාවක් පවතින අතර, මෙම කාලයේ සාමාන්‍ය වැසි තත්වයට වඩා මද වැඩිවීමක් මෙම ප්‍රදේශ වලින් අපේක්ෂා කරයි. නමුත් නැගෙනහිර සහ ඌව පළාත්වල සාමාන්‍යය වැසි තත්වයට වඩා අඩුවීමක් බලාපොරොත්තු වන අතර, සෙසු ප්‍රදේශ වල සාමාන්‍යය වැසි තත්වයම අපේක්ෂා කරයි.

3 සතිය: (ඔක්තෝම්බර් 22 -28)

දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ සාමාන්‍යය හැකියාවක් පවතී. කෙසේ වෙතත් දිවයින ආශ්‍රිතව ඇතිවන වැසි තත්වය මෙම කාලයේ සාමාන්‍ය වැසි තත්වයට වඩා අඩු වීමක් අපේක්ෂා කරයි.

4 සතිය: (ඔක්තෝම්බර් 29 - නොවැම්බර් 04)

දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ තරමක වැඩි හැකියාවක් පවතී. එසේම දිවයිනේ නිරිතදිග, වයඹදිග හා මධ්‍යම කඳුකර ප්‍රදේශ ආශ්‍රිතව මෙම වැසි වැඩි වශයෙන් අපේක්ෂා කරයි. දිවයිනේ උතුරු ප්‍රදේශ වල ඇති වන වැසි තත්වය මෙම කාලයේ සාමාන්‍යය අගයට වඩා වැඩි වීමක් අපේක්ෂා කරන අතර, සෙසු ප්‍රදේශ වල දී සාමාන්‍යය වැසි තත්වයම බාලාපොරොත්තු විය හැක.